www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

42913

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම : .............................................................. විභාග අංකය : ....................................

## I කොටස

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම සුදුසු නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගත්තේ,
1. වෙසක් පොහොය දිනයක දී ය.
2. පොසොන් පොහොය දිනයක දී ය.
3. ඇසල පොහොය දිනයක දී ය.
4. නිකිණි පොහොය දිනයක දී ය.

(2) මහාමායා දේවිය කලුරිය කරන විට සිදුහත් කුමාරුගේ වයස,
1. දින 3 කි. 2. දින 5 කි. 3. දින 7 කි. 4. දින 9 කි.

(3) සතර පෙර නිමිති පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මහල්ලෙක්, ලෙඩෙක්, පැවිදි රුවක්, මළමිණියක්
2. ලෙඩෙක්, මහල්ලෙක්, මළමිණියක්, පැවිදි රුවක්
3. මහල්ලෙක්, පැවිදි රුවක්, ලෙඩෙක්, මළමිණියක්
4. මහල්ලෙක්, ලෙඩෙක් මළමිණියක්, පැවිදි රුවක්

(4) ඔබ විහාරස්ථානයට ගිය විටදී වන්දනාමාන කරනු ලබන නිවැරදි පිළිවෙළ,
1. ශාරීරික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, උද්දේශික චෛත්‍යය
2. පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය, උද්දේශික චෛත්‍යය
3. උද්දේශික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය
4. ශාරීරික චෛත්‍යය, උද්දේශික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය

(5) මෙත් වැඩීමෙන් ලැබෙන අනුසස් සංඛ්‍යාව
1. 3 කි. 2. 7 කි. 3. 9 කි. 4. 11 කි.

(6) රාහුල හිමි රහත්භාවයට පත්වීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර ධර්මය වනුයේ,
1. චුල්ලරාහුලෝවාද සූත්‍රයයි.
2. මංගල සූත්‍රයයි.
3. දම්සක් පැවතුම් සූත්‍රයයි.
4. අනත්තලක්ඛන සූත්‍රයයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(7) දියුණුවේ රන් දොරටු අතරට ඇතුළත් නොවනුයේ,

1. කම්මැලි නොවීමයි.
2. සිල්වත් බවයි.
3. කෙසේ හෝ ජීවත් වීමයි.
4. නිරෝගී වීමයි.

(8) දහමෙහි සඳහන් ආකාරයට සිල්වත්වීමේ ආනිසංස සංඛ්‍යාව

1. 3 කි.
2. 5 කි.
3. 7 කි.
4. 9 කි.

(9) ත්‍රිකෝටිපාරිශුද්ධ ශීලයට අයත් නොවන අංගයකි.

1. පව්කම් නොකිරීම.
2. පව්කම් නොකරවීම.
3. අන් අය කරන පව් අනුමත නොකරවීම.
4. අන් අය ලවා වැරදි කරවීමට පෙළඹවීම.

(10) සතර බ්‍රහ්මවිහරණ ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
2. දානය, ප්‍රිය වචනය, අර්ථ චරියාව, සමානාත්මතාව
3. ඡන්දය, ද්වේෂය, භය, මෝහය
4. බුද්ධානුස්සති, ධම්මානුස්සති, මෙත්තානුස්සති, සංඝානුස්සති

(11) "අභියෝග ජයගත් තරුණයා" යන පාඩම සකස් කිරීමට හේතු වූ ජාතක කථාව,

1. වණ්ණුපථ ජාතකය
2. සාම ජාතකය
3. වෙස්සන්තර ජාතකය
4. මස මානවක ජාතකය

(12) තමා ගැන සිතා අන් අයට අවැඩ පිණිස හේතුවන ක්‍රියාවන්ගෙන් වැළකී, වැඩ පිණිස හේතුවන ක්‍රියාවන්හි නිරත වීම හඳුන්වනුයේ,

1. අත්තූපනායික ධර්ම පර්යාය නමිනි.
2. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය නමිනි
3. අධිපති ධර්ම නමිනි.
4. පංචශීල ප්‍රතිපදාව නමිනි.

(13) බුදුරජාණන් වහන්සේ පරිසරයට බොහෝ සෙයින් ඇලුම් කළ නිසා පරිසරය ආරක්ෂා කිරීමේ වටිනාකම දේශනා කළහ. පරිසරය ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකමකි.

ඒ අනුව ලෝක පරිසර දිනය ලෙස නම් කර ඇත්තේ,

1. මැයි 01 දිනයයි.
2. මැයි 08 දිනයයි.
3. ජුනි 05 දිනයයි.
4. ඔක්තෝබර් 06 දිනයයි.

(14) පරිසර දූෂණයට ඉවහල්වන හේතු සාධකයක් වන්නේ,

1. ගහකොළ කපා ඉවත් කර ගොඩනැගිලි ඉදි කිරීමට කටයුතු කිරීම
2. ගංගාවල ඇති වැලි ගොඩ දැමීමට විරුද්ධව කටයුතු කිරීම
3. වනාන්තරවල ඇති සතා සිව්පාවන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
4. ජල සම්පත සුරකීමේ අගය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම

(15) බුදු දහම ශ්‍රී ලංකාවට ලැබෙන විට ශ්‍රී ලංකාවේ රජකම් කළ රජතුමා වනුයේ,

1. දුටුගැමුණු රජතුමා ය.
2. පණ්ඩුකාභය රජතුමා ය.
3. වීර පරාක්‍රමබාහු රජතුමා ය.
4. දෙවන පැතිස් රජතුමා ය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(16) දුමින්දාගමනය යනුවෙන් හඳුන්වන්නේ,
1. ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන ඒමයි.
2. ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධිය රැගෙන ඒමයි.
3. ශ්‍රී ලංකාවට දන්ත ධාතූන් වහන්සේ රැගෙන ඒමයි.
4. ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටු වීමයි.

(17) බුදුරජාණන් වහන්සේ සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ බොහෝ උපදෙස් ලබා දී ඇත්තේ,
1. කරණීයමෙත්ත සූත්‍රයේ ය. 2. මංගල සූත්‍රයේ ය.
3. රතන සූත්‍රයේ ය. 4. කුල සූත්‍රයේ ය.

(18) "දැඩි ලෝභය දුකට පත්වීමට හේතු වේ" යන පණිවුඩය අපට ලබා දෙනුයේ,
1. ලෝමහංස ජාතකයෙනි. 2. ස්වර්ණ හංස ජාතකයෙනි.
3. සත්තුභත්ථ ජාතකයෙනි. 4. මස මානවක ජාතකයෙනි.

(19) බුදු දහමට අනුව ශ්‍රද්ධාවේ ප්‍රභේද ගණන,
1. 2 කි. 2. 5 කි. 3. 7 කි. 4. 9 කි.

(20) ලංකාවේ බුද්ධ ශාසනයේ පළමුව පැවිද්ද ලබා ගත්තේ,
1. නන්ද කුමාරයා ය. 2. අරිට්ඨ කුමාරයා ය.
3. අනුරුද්ධ කුමාරයා ය. 4. ආනන්ද කුමාරයා ය.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනිකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වෙයි.

---

(01) තුන්වන වාරයේ ඔබ විසින් පංති කාමරය තුළ දී සිදු කරන ලද ධර්ම සාකච්ඡාව ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(i) ධර්ම සාකච්ඡාව සඳහා ඔබ යොදා ගත් පාඩමේ නම කුමක් ද?
(ii) ධර්ම සාකච්ඡාවට ඔබ උපදෙස් ලබාගත් දෙදෙනෙකු නම් කරන්න.
(iii) ධර්ම සාකච්ඡාව සඳහා ඔබට ලැබුණු මාතෘකාව කුමක් ද?
(iv) ධර්ම සාකච්ඡාවට සූදානම් වීමේ දී ඔබට මුහුණ පාන්නට සිදු වූ ගැටළු දෙකක් සඳහන් කරන්න.
(v) ධර්ම සාකච්ඡාව සාර්ථක කර ගැනීම උදෙසා ඔබ විසින් භාවිතා කරන ලද උපකරණ හෝ ද්‍රව්‍යය දෙකක් නම් කරන්න.
(vi) සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කරන විට රැගෙන ආවේ මොනවා ද?
(vii) ලාංකීය භික්ෂුණී ශාසනයේ පළමුව පැවිදි වූ කාන්තාව කවු ද?
(viii) සඟමිත් තෙරණියගේ වැඩම වීමෙන් ලාංකීය ජනතාවට ලැබුණු දායාද දෙකක් ලියන්න.
(ix) ධර්ම සාකච්ඡාවට සහභාගි වීම මගින් ඔබට ලැබුණු අත්දැකීම් දෙකක් සඳහන් කරන්න.
(x) ධර්ම සාකච්ඡාව තුළින් ඔබේ ජීවිතයට ලබාගත් ආදර්ශ දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(02) (i) සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදු බවට පත්වන බව සඳහන් කරන ලද්දේ කවුරුන් විසින් ද?. (ල. 2)

(ii) සිදුහත් කුමරු වෙනුවෙන් සකසා තිබූ මාලිගා තුන නම් කරන්න. (ල. 3)

(iii) සිදුහත් කුමරුගේ චරිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ අතුරින් පහක් ලියා දක්වන්න. (ල. 5)

(03) (i) 'ඉතිපිසෝ භගවා අරහං...' යන පාඨයෙන් වන්දනා කරනු ලබන්නේ ත්‍රිවිධ රත්නයෙන් කුමන රත්නයකට ද? (ල. 2)

(ii) පූජා ද්‍රව්‍ය අත ගස්වා පූජා කළ යුත්තේ පිළිවෙලකට ය. එයින් පළමු, දෙවන හා තෙවන අංග නම් කරන්න. (ල. 3)

(iii) පන්සලට ගොස් ආගමික වතාවත් ඉටු කිරීමට ඔබ සූදානම් වන ආකාරය ගැන කරුණු පහක් ලියා දක්වන්න. (ල. 5)

(04) (i) වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්

ගොල්ලේ පිපෙන පන්මල වාසනාවන්

.......................................................................

.......................................................................

මෙම පද්‍යයෙහි ඉතිරි කොටස් සම්පූර්ණ කර ලියන්න. (ල. 2)

(ii) දරුවන් වන අපට මව්පියන් විසින් සලකන ආකාරය පාඩමෙහි කරුණු පහකින් දක්වා ඇත. එයින් තුනක් ලියන්න. (ල. 3)

(iii) මව්පියන්ට දරුවන් වන අප විසින් උපස්ථාන කළ යුතු ආකාරය ගැන සඳහන් වන වාක්‍ය පහක් ඔබේ වචනයෙන් ලියන්න. (ල. 5)

(05) (i) මඝ කුමාරයා නිරන්තරව ආරක්ෂා කරන ලද සීලය කුමක් ද? (ල. 2)

(ii) මඝ කුමරු ඇතුළු කණ්ඩායම විසින් කරන ලද සමාජ සේවා කටයුතු තුනක් සඳහන් කරන්න. (ල. 3)

(iii) මඝ කුමරුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ පහක් ලියා දක්වන්න. (ල. 5)

(06) (i) සබ්බේ තසන්ති දණ්ඩස්ස

සබ්බේ භායන්ති මච්චුනෝ

.......................................................................

.......................................................................

යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ල. 2)

(ii) එම ගාථාවෙහි අර්ථය ලියා දක්වන්න. (ල. 3)

(iii) 'අපි සතුන් නොමරමු' යන මාතෘකාව යටතේ වාක්‍ය පහක් ගොඩනගන්න. (ල. 5)

(07) (i) මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කළේ කුමන පොහොය දිනක ද? (ල. 2)

(ii) මිහිඳු මහ රහතන් වහන්සේ සමග ලංකාවට වැඩි පිරිස නම් කරන්න. (ල. 3)

(iii) මිහිඳු හිමිගේ ආගමනය නිසා ලංකාවේ ඇති වූ ශාසනික ප්‍රබෝධය ගැන කරුණු පහක් ලියන්න. (ල. 5)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk